One who knows the ropes, suffers no pitfalls...!

උපාය දන්නෝ අපායේ නොවැටෙති!

Many years ago in a small Indian village, a farmer had the misfortune of owing a large sum of money to a village moneylender. The moneylender, who was old and ugly, fancied the farmer's beautiful daughter. So he proposed a bargain.

He said he would forgo the farmer's debt if he could marry his daughter. Both the farmer and his daughter were horrified by the proposal.

So the cunning moneylender suggested that they let providence decide the matter. He told them that he would put **a black pebble** and **a white pebble** into an empty money bag. Then the girl would have to pick one pebble from the bag.

If she picked the black pebble, she would become his wife and her father's debt would be forgiven.

If she picked the white pebble she need not marry him and her father's debt would still be forgiven.

But if she refused to pick a pebble, her father would be thrown into jail.

They were standing on a pebble strewn path in the farmer's field. As they talked, the moneylender bent over to pick up two pebbles. As he picked them up, the sharp-eyed girl noticed that he had picked up two Black Pebbles and put them into the bag. He then asked the girl to pick a pebble from the bag.

Now, imagine that you were standing in the field.. What would you have done if you were the girl? If you had to advise her, what would you have told her? Careful analysis would produce three possibilities:

The girl should refuse to take a pebble.

The girl should show that there were two black pebbles in the bag and expose the money-lender as a cheat.

The girl should pick a black pebble and sacrifice herself in order to save her father from his debt and imprisonment.

Take a moment to ponder over the story. The above story is used with the hope that it will make us appreciate the difference between lateral and logical thinking. The girl's dilemma cannot be solved with traditional logical thinking. Think of the consequences if she chooses ahe above logical answers. What would you recommend to the Girl to do?

Well, here is what she did ....

The girl put her hand into the moneybag and drew out a pebble. Without looking at it, she fumbled and let it fall onto the pebble-strewn path where it immediately became lost among all the other pebbles.

" Oh, how clumsy of me," she said. " But never mind, if you look into the bag for one that is left, you will be able to tell which pebble I picked."

Since the remaining pebble is black, it must be assumed that she had picked the white one. And since the money-lender dared not admit his dishonesty, the girl changed what seemed an impossible situation into an extremely advantageous one.

MORAL OF THE STORY:

Most complex problems do have a solution. It is only that we don't attempt to think.

This story is about the difference between lateral and logical thinking.

ඉන්දියාවේ ඈත ගමක විසූ ගොවියෙක් තම ගොවිතැන් කටයුතු සඳහා පොලීකාරයෙකු ගෙන් විශාල මුදලක් ණයට ගෙන තිබුණේය. වයස්ගත, එමෙන්ම අවලස්සන පෙනුමෙන් යුත් පොලීකාරයා නිතර ඇවිත් මුදල් ඉල්ලා කරදර කළේය. එහෙත් එය ගෙවන්නට ගොවියාට හැකිකමක් තිබුණේ නැත. ගොවියාගේ ඉතා තරුණ, හැඩකාර දියණිය වෙත ඇසගසාගෙන සිටි පොලීකාරයා දිනක් යෝජනාවක් කළේය. එනම් ඔහුට ගොවියගේ දියණිය විවාහ කර දුන්නොත් ගෙවන්නට ඇති ණය සියල්ල කටුගා දමන බව ය. එම යෝජනාව අසා ගොවියා ද දියණිය ද ඉමහත් කේන්තියට ද පිළිකුළට ද පත්වූ නමුත් ඒ බව පෙන්නුවේ නැත.

කපටි පොලීකාරයා යෝජනා කළේ තීන්දුව දෙවියන්ට බාර කළ යුතු බවයි. එතැන මිදුලේ රවුම් හැඩ ඇති නොයෙක් පාටින් යුත් කුඩා ගල්කැට රාශියක් විසිරී තිබිණ. ඔහු කීවේ තමා එයින් කළු පාට ගලක්, හා සුදුපාට ගලක් අහුලා අත තිබූ කුඩා හිස් රෙදි මල්ලට දමන බවයි. තරුණිය අත දමා ඉන් එක කැටයක් එළියට ගත යුතුය. එය කළුපාට ගලක් නම්, ඇය ඔහු හා විවාහ විය යුතුය. එවිට ඇගේ පියා ණයෙන් නිදහස් වේ. ඒ ගල සුදු ගලක් වූයේ නම් ඇය ඔහු හා විවාහ වියයුතු නැත. එවිට ද පියා ණයෙන් නිදහස් වන්නේය. ඇය මුරණ්ඩු ලෙස ගලක් ගැනීම ප්‍රතික්ෂේප කළොත් වන්නේ ගොවියාට හිරේ යන්නට ය.

කරන්නට යන දේ විස්තර කිරීමෙන් පසු පොලීකාරයා පහත් වී ගල් කැට දෙකක් අහුලා කුඩා මල්ලට දැම්මේය. ඔහුගේ අණට කීකරු වෙනවා හැරෙන්නට වෙනත් විකල්පයක් දැන් නැති බව ඇයට වැටහුණේය.

එහෙත් පොලීකාර මහල්ලා ගල් අහුලද්දී කළ කපටි වැඩක් විපරමින් ඇස් කොණින් බලා සිටි තරුණිය දුටුවා ය. එනම් ඔහු උවමනා වෙන්ම අහුලා ගත්තේ කලුපාට ගල් කැට දෙකක් ම බවය. ඇය දුටු බව ඔහු නොදත්තේය. පොලීකාරයා මල්ල තරුණිය දෙසට දිගු කොට අත දමා ගලක් ගන්නට ඇරයුම් කළේය.

දැන් සිතන්න! ඔබ මේ අවස්ථාවට මුහුණ දුන්නේ නම් ඔබ කුමක් කරන්නෙහිද? තරුණිය කළ යුතු කුමක්දැයි උපදෙස් දෙන්නට ඔබට සිදුවී නම් කුමන උපදෙසක් ඔබ ඇයට දෙනු ඇද්ද? ප්‍රශ්නය දෙස හොඳින් විමර්ශණය කළහොත් ඇය කළ යුතු දේවල් මෙතැන ඇත්තේ තුනකි.

A. තරුණිය ගලක් ගැනීම කෙළින්ම ප්‍රතික්ෂේප කළ යුතුය.

B. පොලීකාරයා එතැන කපටි හොර වැඩක් කර ඇති බව ඔහුගේ මුහුණටම කියා හොරකම එළිකළ යුතුය.

C. මල්ලට අත දමා කලුපාට ගල ගෙන පොලීකාරයා සහ විවාහයට කැමති විය යුතුය. ඒ අනුව තම පියා ණයෙන් නිදහස් වීමටද, හිරේ නෙවැටීමටද හේතු වනු පිණිස තම තරුණ ජීවිතය මහල්ලාට පිදිය යුතුය.

ගතානුගතික තර්කයට චින්තනයට අනුව නම් කරන්නට වන්නේ ඔය ඉහතකී විධි තුනෙන් එකකි. වෙන විකල්ප නැත. එහෙම සිතුවහොත් මේ උගුලෙන් කිසිදා ගැලවෙන්නට නොලැබේ. තර්ක පැත්තකට විසිකර මොළේ පාවිච්චි කළ යුත්තේ මෙන්න මේ අවස්ථාවලය.

ඒ තරුණිය ඊළඟට කළ දේ බලන්න.

තරුණිය මල්ලට අත දමා ගලක් ගෙන, ඒ දෙස නොබලාම එම ගල බිම වැටෙන්නට අත හැරී යාය. එය උවමනාවෙන් කළ දෙයක් නොව, ඉබේ ඇගේ නොසැලකිල්ලෙන් වැටුණා සේ පෙනිණ. ඒ ගල වැටුණේ බිම ඇති විවිධ පාටින් යුත් ගල් කැට අතරට නිසා එය සොයාගත නොහැකි විය. " අයියෝ මොකක්ද ඒ වුණේ....? අන්න ගල බිම වැටුණා... අපොයි මේ ගල් ගොඩේ කොහොමද දැන් ඒක මොකක්ද කියලා දැනගන්නෙ....? කමක් නෑ...." ඇය පොලීකාරයාට කීවාය. " දැන් මේ මල්ලෙ ඉතුරු ගලක් තියනවා නේ.... ඒකෙ පාටෙන් හොයා ගන්න පුළුවන් මම ගත්තෙ ගලේ පාට මොකක්ද කියලා... නේද....?"

පොලීකාර මහල්ලාට කට උත්තර නැති විය. මල්ලේ තිබෙන්නේ ඉතිරිව කලු පාට ගලක් නිසා තරුණිය ගත්තේ සුදු පාට ගල බව ඉබේම නිගමනය වේ. පොලීකාරයා නිහඬවුනේ කතා කළා නම් ඔහුගේ වංචාව අසුවන නිසාය. දැන් ඇය මහල්ලා හා විවාහ විය යුතු නැත. එසේම ගොවියා දෙන්නට තිබූ ණය මුදලද දැන් අහෝ සිය. ඉතා අමාරු දුෂ්කර අවස්ථාවක් නුවණ මෙහෙයවා ඇය තම වාසියට හරවා ගත්තාය.

ආදර්ශය

බොහෝ සංකීර්ණ ප්‍රශ්න වලට විසඳුම් ඇත. වරද නම් අප සිතන්නට උත්සාහ නොකිරීමය.

♦ දීපා සඳමාලි හේරත්

Deepa Sandamali Herath - *USA*

එළුවන්ගේ බෙලි කැපීමේ මුන්නේස්වරම් මහා උත්සවය

හලාවත මුන්නේෂ්වරම් හින්දු කෝවිලේ වසරක් පාසා පැවැත්වෙන එළුවන් සියගණනක් ගෙනැවිත් කෝවිල් භූමියේම උන්ගේ බෙලි කපා හදුකාලී නම් දෙවඟනට කරන බිලිපූජාව පසුගිය මස 25 වෙනිදා පොලිස් ආරක්ෂාවද ඇතිව වැඩි පිරිසකට ඇතුල් වන්නට නොදී ඉතා සුපරීක්ෂාකාරීව පවත්වා ඇති බව වාර්තාවේ. මෙම මහා සත්ව සංහාරයට එරෙහිව ශ්‍රීලංකාවේ බොහෝ දෙන, විශේෂයෙන් බෞද්ධ ජනතාව මහත් උද්ඝෝෂණයක් කළද ඉන් පලක් නුවූයේය.

දේවාලයේ ප්‍රධාන පූසාරි තැන කියන්නේ පරම්පරා ගණනක් තිස්සේ පවත්වාගෙන එන එම සත්ව බිලිපූජාව බැතිමතුන්ගේ උවමනාවට මහා හදුකාලී මාතාවට කරන උපහාරයක් නිසා එය නැවැත්විය නොහැකි බවයි. එහෙත් ලංකාව වැනි බහුතරයක් බෞද්ධයින් ජීවත්වන රටක ධර්මද්වීප යයි කියන රටක එවැනි අමානුෂික සත්ව ඝාතන තහනම් කළයුතු බව බොහෝ අයගේ මතයයි. සමස්ථ ලංකා හින්දු ආගමික පර්ෂදයද මේ බිලිපූජාවට තදින් විරුද්ධව සිටිති.

ආචාර්ය මර්වින් සිල්වාගේ වෘක්ෂ බන්ධන නාට්‍යය

වෘක්ෂ බන්ධන නාට්‍යයේ ජවනිකාවක්. නාට්‍යයේ නිශ්පාදක මර්වින් සිල්වාම (වමේ මොබයිලයක් කනේ තබාගෙන) එහි ප්‍රධාන භූමිකාව රඟපායි. සහාය නළු සමාධි නිලධාරි මොහිදීන් ගහට බැඳී සිටියි. සෙසු චරිත රඟපාන්නේ මාධ්‍යවේදීන් සහ කැමරාකාරයෝය. මෙයට ප්‍රේක්ෂක ප්‍රතිචාරය අති මහත්ය.

අපේ සම්භාව්‍ය නාට්‍යකරුවන් බොහොම දෙනෙක් මිය පරලොව ගිහිල්ලා. ඒ නාට්‍යකරුවන් සහ නාට්‍යයන් තවමත් අපේ සිත්වල නොමැකෙන විදියට රැඳිලා තියනවා. ඒ අයගේ රූප දැනුත් අපට මැවිලා පේනවා. නාට්‍යයක් අවසානයේ වේදිකාවේ කෙරෙන තිර කැඳවුමේදී (curtain call) ලුම්බිණියේ, ජෝන්ද සිල්වා රඟහලේ, රාමකෘෂ්ණා හෝල් එකේ, නැත්නම්, ලයනල් වෙන්ඩ්ට් ශාලාවේ, මේ වැනි කොතනදීත් දැත් ඔසවාගෙන, පිටුපස සිට ඉදිරියට එන ඒ ශ්‍රේෂ්ඨ මුහුණු මට මතක් වෙනවා. මහාචාර්‍ය සරච්චන්ද්‍ර, සුගතපාල ද සිල්වා, දයානන්ද ගුණවර්ධන, සයිමන් නවගත්තේ ගම, පතිරාජ එල්. එස්. දයානන්ද යන මේ පිරිසට මේ නොබෝ දා අප අතරින් වෙන්වුණු ආර්. ආර්. සමරකෝන් එක් වෙනවා.

එතකොට ඒ නාට්‍ය - **මනමෙ, සිංහබාහු, මහාසාර, බක්මහ දීගෙ, ගජමන් පුවත, නිල් කටරොළු මල්, හරිම බඩු හයක්, ගංගාවක් සපත්තු කබලක් මරණයක්, පුස් ලෝඩං, කවුරුවත් එන්නෙ නෑ, කැළණි පාලම, අහසින් වැටුණු මිනිස්සු,** ආදී නිර්මාණ ගැන මුළු දවසක් කතා කරන්න දේවල් තියෙනවා.

මේ ඉහතින් කියපු නාට්‍යකරුවො නැතිවුනාම පුවත්පත් වල ලියැවුණු ලිපි රාශියක් මම දැක්කා. ඒවයින් කියවුණේ තව දීර්ඝ කාලෙකට අපේ රටේ නිර්මාණශීලී නාට්‍යකරුවන් බිහිවන එකක් නෑ කියලා. නාට්‍ය ක්ෂෙත්‍රයේ ලොකු හිඩැසක් ඇති වෙන්න යන බවත් ඒ ලේඛකයන් හැම දෙනාම එකාවන්ව ලියලා තිබුණා. ඉතින් සැහෙන්න දුකෙන් කල්පනා කර කර ඉන්න කොට, මෙන්න බොලේ, සැහෙන නෙවෙයි නොසැහෙන ප්‍රීතිමත් ආරංචියක්...! ඒ මොකක්ද? ශ්‍රීලංකාවේ නාට්‍ය ක්ෂෙත්‍රයට අළුත්ම නිර්මාණ කරුවෙක් මේ නොබෝදා එක්වුණු බව. ඔහුගෙ නම ආචාර්‍ය මර්වින් සිල්වා. නාට්‍යයේ නම: වෘක්ෂ බන්ධන.

නාට්‍යයක් ජනප්‍රිය වන්නේ ඒ තේමාව නිසාම පමණක් නෙවෙයි. මොකක් හෝ හේතුවකින් ඒක රටේ ජනතාවගේ මීටරේට අනුවුනොත් වුනොත් විතරයි. දැනට මේ අළුත් නාට්‍යය ගැන හරියට මිනිස්සු කතාවෙනවා. සමහරු කියනවා මේ වෘක්ෂ බන්ධන නාට්‍යය කොහොඹ කංකාරිය, දෙවොල් මඩු, වගේ ලෙඩ සනීප කරන්න හදාපු එකක් බව. අපි දන්නවා කොහොඹ කංකාරිය නටන්නේ, ගමේ වේදිකාගතකරන්නේ දෙයියන්ගෙ ලෙඩ, අම්මවරුන්ගෙ ලෙඩ හැදුනම. ඒවාට ප්‍රතිකාරයක් හැටියට. ඉතින් බොහෝ දෙනා දැන් පිළිඅරං තියෙනවා මර්වින් සිල්වගේ වෘක්ෂ බන්ධන නාඩගම (ඇත්තට මේක නාට්‍යයකට වඩා නාඩගමක් තමයි) ලංකාවේ දැනට පැතිරිලා තියන ඩෙංගු වසංගතයට නොව රිදින ප්‍රතිකාරයක් හැටියට හදපු එකක් කියලා.

මෙන්න ඒකෙ එක දර්ශණයක් ! මර්වින් කඹයකුත් අරං සමෘද්ධි නිලධාරීන් වටකරන් ඉන්නවා. එක නිලධාරියෙක් අඹ ගහ ළඟටම වෙලා ඉන්නවා. (ඒ කියන්නෙ අධ්‍යක්ෂක කලින් ම සීන් එක පහදලා දෙන්න ඇති නේ. ඒක නේ අර පොර ගහ ළඟටම වෙලා ඉන්නෙ) ඔන්න මෑන්ව අල්ලලා ගහේ බඳිනවා. ගෑණු ටිකක් වටවෙලා බොරුවට කෑගහනවා. පත්තරකාරයො කැමරා අටවගෙන පොටෝ ගන්නවා.(ඒ ගොල්ල දන්නෙ නෑ මර්වින් ඒ අයත් ගොනාට ඇන්දු බව) සමෘධි නිලධාරි ස්ට්‍රයික් කරන්න ලෑස්ති වෙනවා. මර්වින් ඇමතිකමෙන් අස්කරනවා. අර සමෘධි කාරයම පස්සෙන්දා කියනවා, ඇමතිතුමා බැන්දෙ නැත, මමම ගහට තියලා වෙලා ගත්තයි කියලා. රජය කියනවා කරපු පරීක්ෂණ වල හැටියට මර්වින් නිර්දෝෂය කියලා. අන්තිමට මේ සේරම ජෝකර් වැඩ බව ඔප්පු වුණා. අන්න එහෙමයි වෘක්ෂ බන්ධන කියන ශ්‍රේෂ්ඨ නිර්මාණය බිහිවුණේ.

ටෙලි නාට්‍ය පිස්සුවෙන් ඉන්න ලංකාවෙ ජනතාවටත් මොකක් හරි නාට්‍යයක් නැත්නම් හරි ප්‍රශ්නයක්. පොල් ගාන්නෙ, පිටි කොටන්නෙ, මුකුණුවැන්න සුද්දකරන්නෙ, දරුවට බත් කවන්නෙ ටෙලි නාට්‍යය බල බලා. ඒක දැන් එහේ ජීවිතේ කොටසක් වෙලා. මර්වින්ට අනේ සිංදු කියන්නත් ඇහැකි. කටහඬ ටිකක් බෙලෙක් සද්දෙට තිබුණට නරකම නැහැ. හැබැයි මේ අත ගහපු නාට්‍ය වැඩේ නම් අන්තිම ඉහළයි. මේ වෘක්ෂ බන්ධන **DVD** එකකට ගහල අර අපිට ලෙඩ අදින බැංකි මුන්ට යවන්න ඕන.

♦ වෙලේගෙදර රාළ London